Department of Education Sabaragamuwa Province/ Weekly School



සැකසුම - එන්.පී. ප්‍රේමලතා මිය. ගුරු උපදේශක (සිංහල) දෙහිඕවිට අධ්‍යාපන කලාපය

සිංහල භාෂාව හා සාහිත්‍යය

# 02 පාඩම - සිංහල අක්ෂර මාලාව

## ➢ ඉගෙනුම් ඵල -

- සිංහල අක්ෂර මාලාව නිවැරදිව අනුපිළිවෙලින් ඉදිරිපත් කරයි.
- ඝෝෂ අඝෝෂ භේදය හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- අන්තඃස්ථාක්ෂර හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- ඌෂ්මාක්ෂර හඳුනාගෙන භාෂා කාර්යයේ දී නිවැරදිව යොදාගනී.
- භාෂා කාර්යයේ දී 'ෆ' අක්ෂරය නිවැරදිව යොදාගනී.

**1.** මුලින් දැක්වෙන වචනයේ අදහස නොදෙන වචනය තෝරන්න.

I. අක්ෂර මාලාව - හෝඩිය, වර්ණමාලාව, අකාරාදිය, ශබ්දමාලාව
II. කෙටි ස්වර - හ්‍රස්ව, අල්පප්‍රාණ, ලුහු ස්වර, ලඝුස්වර
III. දීර්ඝ ස්වර - මහාප්‍රාණ, දික් ස්වර, ගුරුස්වර, දිගුස්වර
IV. ව්‍යඤ්ජනාක්ෂර - ගතකුරු, මළකුරු, හල් අකුරු, ගාත්‍රාක්ෂර
V. නාසිකා අක්ෂර - නාසිකාක්ෂර, නාසික්‍ය, අනුනාසික, අර්ධානුනාසික
VI. ස්වර - පණකුරු, අනුස්වාර, සර, ප්‍රාණාක්ෂර

**2.** මුලින් දැක්වෙන ස්වරයෙන් ආරම්භ නොවන වචනය යටින් ඉරක් අඳින්න.

I. හ්‍රස්ව - ඉන්ධන, බලගුව, ඌනතාව, අමාත්‍ය
II. දීර්ඝ - ඊශ්වර, ඇමුණුම, ආශ්‍රමය, ඒ දණ්ඩ

**3.** මුලින් දැක්වෙන අක්ෂර වර්ගයට අයත් අකුරක් නොයෙදුණු වචනය තෝරන්න.

I. අනුස්වාරය - සංසදය, අංගණය, සංචාරය, තණ්හාව
II. විසර්ගය - අන්තඃඛණ්ඩය, මනඃකල්පිත, වහ්නිජාලා, අන්තඃපුරය

**4.** මුලින් දී ඇති අක්ෂර වර්ගයට අයත් අකුරු පමණක් සහිත වචනය කුමක් ද?

I. අල්පප්‍රාණ - ගනකම, කගපත, කුලගොත, ගම්බද
II. අන්තඃස්ථ - රියගල, යමහල, වරලස, ලැවරිය
III. ඌෂ්ම - සහසැස්, ශිෂ්‍යාව, ශික්ෂණ, ෂඩශ්‍රය

**5.** මුලින් දැක්වෙන වර්ගවලට අයත් අකුරු පමණක් යෙදුණු වචනය තෝරන්න.

I. මහප්‍රාණ - ධර්මිෂ්ඨ, ලඝුලේඛන, බොජ්ජඩග, පාඨග්‍රන්ථ
II. නාසික්‍ය - බුරන්ධර, රණභූමිය, පිපිඤ්ඤා, මානසවිල
III. සඤ්ඤක - කටු ඉඹුල, දඬු අඬුව, කිඳුරඟන, අඟ පසඟ

**6.** මුලින් දැක්වෙන අක්ෂර වර්ගයන්ට අයත් අකුරකින් ආරම්භ වන වචන 3 බැගින් ලියන්න.

I. මූර්ධජ අක්ෂර - .........................., .........................., ..........................
II. දන්තජ අක්ෂර - .........................., .........................., ..........................
III. ඕෂ්ඨජ අක්ෂර - .........................., .........................., ..........................
IV. කණ්ඨජ අක්ෂර - .........................., .........................., ..........................
V. තාලුජ අක්ෂර - .........................., .........................., ..........................

සිංහල සාහිත්‍යය සංග්‍රහය

1. පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I. යෝධයන් විසින් උත්සවය සඳහා සූදානම් කර තිබූ සියලු රා මස් පිරූ සැළවල් සුනු විසුනු කර දැමීමේ සැබෑ හේතුව කුමක් ද?

.....................................................................................................................

II. මියුලු නුවර වටලෑමට ආසන්න හේතුව ලියන්න.

.....................................................................................................................

III. බ්‍රහ්මදත්ත රජුගේ චතුරංගනී සේනාවේ කිනම් සේනාවක් පහත දැක්වෙන උපමා මගින් පළවේදැ'යි තෝරා යා කරන්න.

| උපමාව | උපමේය |
|---|---|
| 1. රජ්ජුරුවන් කෝප නැමති ගින්නෙන් නැඟි දුම් කඳ සේ | අශ්ව සේනාව |
| 2. අකාශ ගංගාවෙහි බිඳි බිඳි දිවෙන්නා වූ රළ පහර සේ | රථ සේනාව |
| 3. සමුද්‍රයෙන් නැංගාවූ මහ තල්මස් කැල සේ | ඇත් සේනාව |
| 4. විකාර වේශයෙන් ආ දසබිම්බරක් මාර සේනාව සේ | පාබල සේනාව |

IV. ජාතක කතා කරුවා කතා රසය ජනනය වන පරිදි යොදා ගෙන ඇති ආකාරය නිදසුන් තුනක්වත් දක්වමින් පහදන්න.

.....................................................................................................................
.....................................................................................................................
.....................................................................................................................
.....................................................................................................................
.....................................................................................................................

2. පහත සඳහන් එක් එක් වාක්‍ය ඛණ්ඩයන් හි ඉරි ඇඳි පදවල අර්ථ වෙන වෙනම ලියා වාක්‍ය ඛණ්ඩයෙහිම අර්ථය ලිහිල් බසින් ලියන්න.

I. මම **කුරුඹිලියෙන්** ඇතුළු නුවරට වැද

.....................................................................................................................
.....................................................................................................................

II. සටන් කළෝ නම් අපගේ සේනා වාහන **මහත්** හෙයින් ඒකාන්තයෙන් ම **පරදූව'යි** කියම් .....................................................................................................

.....................................................................................................................

III. **<u>සාල්ලෙක</u>** ලා ලා පාතට බාන කෙනෙකුන් මෙන් කේවට්ට බමුණා හිස **<u>වර්චස්</u>** පිඬක්
හෙළ ..........................................................................................................
..........................................................................................................

IV. පණ්ඩිතවන් වහන්සේ ගිරා **<u>පෝතකයානට</u>** කළ මනා සත්කාර කොට හෙවත් මීයෙන් හැනූ විළඳ කවා, මී පැනි පොවා බෙත් තෙලින් **<u>පියා සඟල මැඩ</u>**
..........................................................................................................
..........................................................................................................

V. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ද කේවට්ටයන්ගේ බස් ගෙන **<u>හස්ත්‍යශ්වාදී</u>** සෙනග පිරිවරා
..........................................................................................................
..........................................................................................................

පිටු සැකසුම - ඒ. වී. චමින්ද විජේකුමාර මයා